ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2016-09-20 |
|---|---|---|---|

පැමිණිලිකරු : එච්.බී මහින්ද දිසානායක මයා,
නව ජයගඟ, දකුණු ඉවුර,
තලාව.

වගඋත්තරකරුවන් : 01. පො.සැ 48154 ආර්.එම් ධර්මසේන මයා,
පොලිස් ස්ථානය,
මන්නාරම (වර්තමාන සේවා ස්ථානය)

02. පො.කො 63656 ඒ. විමල් චන්ද්‍රසේන මයා,
පාලිස් ස්ථානය,
තලාව.

03. පො.කො 39625 එස්.එස්.ආර් තිලකරත්න මයා,
පොලිස් ස්ථානය,
තලාව.

<u>පැමිණිලි අංකය : **HRC/AP/734/2013**</u>

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2013.12.18 වන දින රාත්‍රී ණය මුදලක් ලබා ගැනීම සඳහා තම යතුරු පැදියෙන් යන අතරතුරදී ජය ගඟ හන්දියේ පොලිස් ජීප් රථයක් තිබෙනු දැක යතුරු පැදිය පැදවීමට අදාළ ලියවිලි තමන් සතුව නොතිබූ හෙයින් යතුරු පැදිය මග නවතා පයින් ගමන් කරමින් සිටියදී පොලිස් නිලධාරීන් තමන්ගෙන් ප්‍රශ්න කර තම හැඳුනුම්පත විමසූ බවත්, එහිදී එය නිවසේ බවට පැවසූ විට තමාට අසභ්‍ය වචනයෙන් බැනවැදී පහරදී තලාව පොලීසියට රැගෙන ගොස් වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කර නැවත පොලිස් ස්ථානය වෙත ගෙන ආ බවත්, සිරමැදිරිය ලඟට ගොස් "ඇතුළට පලයන්" කියා වම් කණට වේගවත් පහරක් දී පයින් ගසා අත්දෙකට මාංචු දමා සිරමැදිරියට රඳවා තැබූ බවත්ය. අනතුරුව බීමත්ව අශෝභන ලෙස හැසිරීම යන චෝදනාව යටතේ තඹුත්තේගම ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165, කින්සි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

2013.12.19 දින පැමිණිලිකරු වෙත ඇප ලැබී ඇති අතර, 2013.12.20 වන දින කණේ තදබල වේදනාවක් ඇති වූ හෙයින් අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් වූ බවත්, එහි 33 වන වාට්ටුවේ 2013.12.23 වන දින දක්වා ප්‍රතිකාර ලැබූ බවත්, පසුව 2013.12.23 වන දින යුධ හමුදා රෝහලට ඇතුළත් වූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ලිඛිත කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇත්තේ පොලිස් නිලධාරින් ඉදිරිපිටදී බීමත්ව ප්‍රසිද්ධ ස්ථානයක අශෝභන ලෙස හැසිරීම මත මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බවයි.

ඒ අනුව මෙම පැමිණිලිකරු 2013.12.18 වන දින පැය 21.00 ට පමණ පොලිස් නිලධාරීන්ගේ අත්අඩංගුවට පත්ව ඇති බවද පොලිස් නිලධාරීන්ගේ අත්අඩංගුවට පැමිණිලිකරු පත්වීමෙන් පසු පොලිස් නිලධාරින් විසින් ඔහුට කිසිදු පහරදීමක් සිදුකර නොමැති බවද සඳහන් කර ඇත.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ ඉහත වගඋත්තරකරුවන් ලෙස නම් කොට ඇති නිලධාරීන් දිවුරුම් ප්‍රකාශ මඟින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2013.12.18 වන දින රාත්‍රී ජංගම රාජකාරියේ යෙදී සිටියදී ප.ව 9.20 ට පමණ මෙම පැමිණිලිකරුව බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ වරදට අත්අඩංගුවට ගනු ලැබූ බවත්, 2013.12.19 වන දින පෙ.ව 9.35ට පොලිස් ඇපමත මුදා හල බවත්ය. එමෙන්ම 2013.12.18 දිනම මෙම පැමිණිලිකරුගේ බීමත් බව හා තුවාල ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා තලාව රෝහලේ වෛද්‍යවරයා වෙත යොමුකරන ලද බවද සඳහන් කර ඇත.

පැමිණිලිකරු හට පොලිස් නිලධාරින් පහරදුන් බවට ප්‍රකාශ කර ඇති මුත් ඔහුට කිසිදු පොලිස් නිලධාරියෙකු පහරදීමක් සිදුකර නොමැති බවද පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලබන බවද වගඋත්තරකරුවන් විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනය :-**

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමේ කටයුතු කර ඇති පො.සැ 48154 ධර්මසේන මහතාගේ විභාග සටහන් අනුව 2013.12.18 වන දින පැය 19.20 ට පමණ පැමිණිලිකරුව බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ වරදට අත්අඩංගුවට ගැනීමට අදාළ සටහන් යොදා ඇත.

මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහුගේ නම හේරත් බණ්ඩාගේ වසන්ත කුමාර බවට ප්‍රකාශ කර ඇති බවට සටහන් යොදා ඇති අතර හේරත් බණ්ඩාගේ වසන්ත කුමාර යන

නමින් පැමිණිලිකරුව තලාව රෝහලේ වෛද්‍යවරයා වෙත 2013.12.18 වන දින පැය 10.55 ට ඉදිරිපත් කර ඇති බවට සටහන් යොදා ඇත.

2013.12.19 වන දින හේරත් බණ්ඩාගේ මහින්ද දිසානායක නමින් පොලීසිය වෙත ප්‍රකාශයක් ලබා දී ඇති අතර 2013.12.19 වන දින මෙම පැමිණිලිකරුට පොලීසිය මඟින් ඇප ලබා දී ඊට අදාළ උධෘතයේ වසන්ත දිසානායක ලෙසට ඇප අත්සන් කර ඇති බවට සටහන් යොදා ඇත.

අංක 20196 යටතේ ප්‍රසිද්ධ ස්ථානයක අශෝභන ලෙස හැසිරීමේ චෝදනාව යටතේ හේරත් බණ්ඩාගේ මහින්ද දිසානායක හෙවත් හේරත් බණ්ඩාගේ වසන්ත කුමාර යන අයව ගරු අධිකරණය වෙත ඇති අතර හේරත් බණ්ඩාගේ වසන්ත කුමාර යන නමින් පැමිණිලිකරුව 2013.12.18 වන දින තලාව රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බවටද ඊට අදාළ වෛද්‍ය වාර්තාව සහ යුධ හමුදා රෝහල වෙතින්ද වෛද්‍ය වාර්තාවක් ලබා ගෙන ඇති බවටද කරුණු ඉදිරිපත් වී ඇත.

**අධිකරණ වෛද්‍ය වාර්තාව :-**

<u>වගඋත්තර පාර්ශවය විසින් 2014.05.20 දින කොමිෂන් සභාව වෙත ලබා දී ඇති සිද්ධියට අදාළ උධෘත වාර්තාව සමඟ ඉදිරිපත් කර ඇති තලාව රෝහලේ වෛද්‍යවරයා වෙතින් ඉදිරිපත් කර ඇති අධිකරණ වෛද්‍ය පෝරමය :-</u>

එහි මත්පැන් ගඳ වහනය වන බවත්, මත්පැන් බී වෙරි වී සිටින බවත්, දක්වා ඇති අතර තුවාල නොමැති බවත් දක්වා ඇත.

<u>කොමිෂන් සභාව විසින් කරන ලද 2015.01.05 දිනැති දැනුම්දීමට අනුව අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති (2013.12.21 දිනැතිව නිකුත් කර ඇති) වෛද්‍ය වාර්තාව :-</u>

පැමිණිලිකරුට අදාළව අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති 3239/2013 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව රෝගියා විසින් ලබා දී ඇති ඉතිහාසය පරිදි "2013.12.18 වෙනිදා පස්වරු 9.30 ට විතර බටුවත්ත හංදියේදී පොලිසියේ තුන්දෙනෙක් මට අතින් පයින් ගැහුවා" යනුවෙන් සටහන් යොදා ඇත.

එහි තුවාල යටතේ පැමිණිලිකරුගේ කණෙහි ශ්‍රවණ පටලය 20%-30% සිදුරු වී ඇති බවත් එය මොට ආයුධයක් මඟින් සිදුව ඇති බවත් දක්වා ඇත. (Left sided tympanic membrane perforation 20%-30%) එහි රෝගියාගෙන් මත්පැන් ගඳ වහනය නොවන බවත්, බීමත්ව නොමැති බවත් දක්වා ඇත.

<u>අනුරාධපුර යුද්ධ හමුදා මූලික රෝහල වෙතින් ලබා දී ඇති වෛද්‍ය වාර්තාව</u>

අනුරාධපුර යුද්ධ හමුදා මූලික රෝහල වෙතින් ලබා දී ඇති 2014.02.12 දිනැති වෛද්‍ය වාර්තාවට අනුව, පැමිණිලිකරුගේ රෝගී ඉතිහාසය ලෙස 'දන්නා පුද්ගලයෙකු විසින් දකුණු කණට සිදුකළ පහරදීමක්' සම්බන්ධයෙන් දක්වා ඇති අතර, වෛද්‍යවරයාගේ රෝග විනිශ්චය ලෙස "වම් කණේ කර්ණ පට හා පටලය සිදුරු වීමක්" සහ "කණ් ඇසීමේ දුර්වලතාවයක්"පවතින බවට දක්වා ඇත. එය බරපතල ගණයේ තුවාල වීමක් ලෙසට දක්වා ඇති අතර, එම තත්වය අනාගතයේදී බලපෑමක් ඇතිකළ හැකි තත්වයක් ලෙසද දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු සිය පැමිණිල්ල මඟින් ප්‍රධාන කොටම සඳහන් කර ඇත්තේ වගඋත්තරකරුවන් විසින් තමන්ව සාධාරණ හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන පහරදී වධහිංසාවට ලක් කළ බවයි.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු බීමත්ව අශෝභන ලෙස හැසිරීම හේතුකොට ගෙන අත්අඩංගුවට ගත් බවත්, පහරදීමක් සිදු නොකළ බවත් ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදු කර නොමැති බවත්ය.
පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2013.12.25 දින දරණ පැමිණිල්ල අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව 2013.12.18 වන දින අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වී ඇති අතර වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති වේලාව රාත්‍රී 9.20 පසු වේලාවක් බවත් එමගින් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ අනුව 2013.12.18 වන දින රාත්‍රී 9.20 ට පමණ පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බවත් තලාව පොලිස් ස්ථානයේ සුළු අපරාධ තොරතුරු සටහන අනුව 2013.12.18 වන දින පැමිණිලිකරුව පැය 21.00 (රාත්‍රී 9.00) අත්අඩංගුවට ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම වගඋත්තර පාර්ශවයේ දිවුරුම් ප්‍රකාශයන්ට අනුව හා ඉදිරිපත් කර ඇති උධෘත අනුව මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ ප්‍රසිද්ධ ස්ථානයක බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ වරදට වන බවද නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරුව 2013.12.18 වන දින තලාව රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බව අංක 442/2013 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය අනුව නිරීක්ෂණය වන අතර මෙකී

අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ වෛද්‍යවරයාගේ මතය යටතේ පැමිණිලිකරු මත්පැන් බී වෙරි වී ඇති බවට සඳහන් කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව 2013.12.18 දින අත්අඩංගුවට ගෙන 2013.12.19 දින පොලිස් ඇප මත මුදාහැර ඇති අතර, 2014.01.09 වන දින තඹුත්තේගම මහේස්ත්‍රාත් අධිකරණය වෙත ප්‍රසිද්ධ ස්ථානයක බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ චෝදනාව යටතේ කරුණු වාර්තා කර ඇති බවද නිරීක්ෂණය වේ.

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති පැමිණිල්ලේ කරුණුත්, වගඋත්තර පාර්ශවයේ කරුණු අනුව හා වෛද්‍යවරයා විසින් ලබා දී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පැමිණිලිකරු බීමත්ව සිටියදී තලාව, බටුවත්ත හන්දියේදී වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවට නිරීක්ෂණය වේ.

නමුත් පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ තමා ඉහත චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලබන බවයි. එමෙන්ම වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් ගොනුකර ඇති බීමත්ව අශෝභන ලෙස හැසිරීමේ චෝදනාව අසත්‍ය චෝදනාවක් බවට තහවුරු කිරීම සඳහා පැමිණිලිකරු වෙතින් ප්‍රබල සාක්ෂි ඉදිරිපත් වීමක් සිදුව නොමැති බැවින් මෙම චෝදනාවට අදාළ නිර්දෝෂීභාවය පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැත.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව නීත්‍යානුකූල නොවන ආකාරයට අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු තහවුරු නොවන බැවින් වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරුගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) හි සඳහන් අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බැව් නිරීක්ෂණය නොවේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව වගඋත්තරකාර පො.සැ 48154 ධර්මසේන යන අය විසින් පැමිණිලිකරුගේ වම් කණට පහරදුන් බව 2014.05.09 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේදී පැවැති පරීක්ෂණයේදී සඳහන් කර ඇත. එමෙන්ම ඔහුගේ 2013.12.25 දිනැති පැමිණිල්ල මඟින්ද මෙම වගඋත්තරකරු ඔහුගේ වම් කණට පහරක් ගසා පයින්ද පහරක් ගසා සිර කුඩුවට දැමූ බව සඳහන් කර ඇත. 2013.12.25 දිනැති පැමිණිල්ල මඟින් පැමිණිලිකරුට පහරදුන් නිලධාරීන් පිළිබඳව ප්‍රකාශයක් සිදුකර නොමැති අතර 2014.05.09 දිනැති කොමිෂන් සභා පරීක්ෂණයේදී පො.සැ 48154 ධර්මසේන මහතා විසින් පැමිණිලිකරුට පහරදුන් බවට ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත කරන ලදැයි පවසන පහරදීම් සම්බන්ධයෙන් අනුරාධපුර ශික්ෂණ රෝහල වෙතින් 2013.12.20 දින සිට 2013.12.24 දින දක්වා නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන

ඇති අතර වැඩිදුර ප්‍රතිකාර සඳහා පැමිණිලිකරුව යුධ හමුදා රෝහල, අනුරාධපුර වෙත යොමුකර ඇති බව අදාළ වෛද්‍ය වාර්තා අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් ලබා දී ඇති 2013.12.21 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව 2013.12.23 දින අනුරාධපුර ශික්ෂණ රෝහලේදී පැමිණිලිකරු අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වී ඇති අතර, එම වාර්තාවට අනුව පැමිණිලිකරුගේ කණෙහි ශ්‍රවණ පටලය 20%-30% සිදුරු වී ඇති බවත් එය මොට ආයුධයක් මඟින් සිදුව ඇති බවත් දක්වා ඇත. (Left sided tympanic membrane perforation 20%-30%)

එසේම අනුරාධපුර යුධ හමුදා රෝහල වෙතින් ලබා දී ඇති 2014.02.12 දින දරණ වෛද්‍ය වාර්තාවට අනුව, "වම් කණේ කර්ණ පට හා පටලය සිදුරු වීමක්" සහ "කණ් ඇසීමේ දුර්වලතාවයක්"පවතින බවට දක්වා ඇත. එය බරපතල ගණයේ තුවාල වීමක් ලෙසට දක්වා ඇති අතර, එම තත්වය අනාගතයේදී බලපෑමක් ඇතිකළ හැකි තත්වයක් ලෙසද දක්වා ඇත.

නමුත් මුල් අවස්ථාවේදී පැමිණිලිකරු විසින් පො.සැ ධර්මසේන නිලධාරියා විසින් අදාළ පහරදීම සිදුකළ බවට දක්වා නොතිබීම හේතුවෙන් නිශ්චිතව අදාළ පහරදීම පො.සැ ධර්මසේන නිලධාරියා විසින්ම සිදුකරන ලදැයි නිගමනය කිරීම දුෂ්කර වී ඇත.

කෙසේ වෙතත් මෙකී සමස්ථ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී පොලිස් දෙපාර්තමේන්තුව භාරයේ සිටියදී, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් එනම්, කෲර අවමන් සහගත සැළකිල්ලකට හෝ වධහිංසාවකට භාජනය නොවී සිටීමේ අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

1. ඒ අනුව පොලිස් දෙපාර්තමේන්තුව විසින් පැමිණිලි පාර්ශවය වෙත රු. 25,000/- ක වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. සුදුසු පියවර ගැනීම සඳහා මෙහි පිටපත් පොලිස්පතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2016.10.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
**Chairperson**
**Human Rights Commission of Sri Lanka**

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුරය.

B/

පොලිස්පතිතුමා
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.
} නිර්දේශයේ පරිදි පියවර ගැනීමට